# හරි වැඩේ...



**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**

2 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

# හරි වැඩේ...



**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**

2 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

කෘතියේ නම : හරි වැඩේ

ප්‍රථම මුද්‍රණය : 2025.01.24

කතාව සහ චිත්‍ර : පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර

කතෘගේ ලිපිනය : අංක: 46/2, පිළවල, ගුන්නෑපාන.

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.

ශ්‍රේණිය : 2 ශ්‍රේණිය A

ISBN අංකය : ISBN 978-624-208-486-2

පරිගණක අක්ෂර, පිටු සැකසුම

: සංඛ පද්ම බණ්ඩාර

කතෘගේ අනෙකුත් කෘති

- කිටියාට පාඩමක්...
- මම ආසයි ඉගෙනගන්න...
- පාට පාට පාට ලෝකේ...
- Rainbow Fairy
- බඩේ අමාරුව
- මට හරියට වැඩ
- කවුද හොරා?
- මම තනියෙන්
- අළු කෑදැත්තා නිරීක්ෂණය

# පිදුම

පෙර පාසලේ ගුරුතුමියන්ට

මගේ පාසලේ ඇදුරුතුමියන්ට

මගේ පාසලේ සොහොයුරියන්ට

මගේ අම්මාට, අප්පච්චීට, මල්ලීට, අත්තාට,

සහ

අත්තම්මාට

බැතියෙන් පුදමි.

# හැඳින්වීම

මෙම පොත “හෙරණගත්කරණී 2024” ව්‍යාපෘතිය යටතේ මහාමායා බාලිකා විද්‍යාලයේ 2 ශ්‍රේණිය ඒ පංතියේ පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර ශිෂ්‍යාව විසින් නිර්මාණය කළ කතාවක් හා චිත්‍ර ඇතුළත් පොතකි.

# ස්තුතිය

පොත් ලිවීමට මහඟු අවස්ථාවක් හා පරිසරයක්

තනා දුන්

මගේ පංතිභාර ගුරුතුමිය වන දමයන්ති රත්නායක ගුරු මෑණියන්ටත්,

හෙරණගත්කරණී 2024 ව්‍යාපෘතියේ සම්භන්ධීකාරක තුමිය වන සමන්මලී ගුරු මෑණියන්ටත්,

හෙරණගත්කරණී 2024 ව්‍යාපෘතියේ නිර්මාපක

සෙනවිරත්න මහලේකම්ගේ ගුරු පියාණන්ටත්

ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමියටත්

අප විද්‍යාලයේ විදුහල්පතිතුමියටත්

ආදරණීය අප්පච්චීටත්, අම්මාටත්, සහ

මල්ලීට

මගේ හද පිරි ස්තුතිය පිරිනමමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

කිඹුල් හාමිට එයගේ ජංගම දුරකථනය නැතුවමම බෑ. කොහේ හරි යනකොට, කෑම කනකොට, ඕනෑ ම වෙලාවක, එයාගේ "ෆෝන් එක" එයාගේ අතේම යි. ඒක නිසා එයා හරි ම අවසිහියෙන් ඉන්නේ.



ඔන්න, දවසක් එයා ගඟේ බෝට්ටුව පදිනවා. ඒත් ෆෝන් එක බල බල ම තමයි. ගඟේ තියන වංගුවක් දැක්කේ නැති නිසා ඉවුරේ වැදිල, බෝට්ටුව පෙරළිලා, එයා ගඟට වැටුණා.  එයා කිඹුලෙක් නිසා, යන්තම් බේරුණා.



තවත් දවසක, එයා වැස්ස වෙලාවක, ෆෝන් එක බල බල හිටියා. හයියෙන් අකුණක් ගැහුවා.
එකෙනුත්, එයා බේරුනේ, කිඹුල්ලු බිම බඩගාගෙන යන අය නිසාම යි.
ඒත්, එයා නම් එකෙන් පාඩමක් ඉගන ගත්තේ නෑ...



ඔන්න, තවත් දවසක් එයා ගියා ගඟේ තිබුණු සාදයකට. ඒක හරිම ලස්සයි. අනික් සත්තු යාළුවෝ, නටල, ගයල, ගොඩක් විනෝද වෙද්දි, කිඹුල් හාමි විතරක් ෆෝන් එක බල බල හිටියා. සාදේ ඉවර වෙනවවත් එයා දන්නෙ නෑ.



ඔන්න, කාලය ගෙවිලා ගිහින් තවත් දවසක කිඹුල් හාමි ගියා ඉබි කොල්ලගේ කෑම කඩේට. කිරිමැටි ඉඹුල් කිරිබත් කන්න. එයා, ඒවා කන්න හරිම ආසයි. කොහොම වුනත්, එයා එදත් කඩේට ගියේ ෆෝන් එක බල බලාම යි. කිඹුල් හාමි වෙනදා වගේ ම කිරිමැටි ඉඹුල් කිරිබත් ඉල්ලුවා, ඉබි කොල්ලාගෙන්. "ඉබි කොල්ලෝ මට ලොකු ඉඹුල් කිරිබත් ගෙඩියක් දෙන්න" එයා, ෆෝන් එක දිහා බලාගෙනම කිව්වා.



ලොකුම ලොකු ඉඹුල් කිරිබත් ගෙඩියක් අරන් ඉබි කොල්ලා ආවා. ෆෝන් එක  දිහා බලාගෙන ම, කිඹුල් හාමි ඉඹුල් කිරිබත් ගෙඩිය කටේ දාගෙන ගිල්ලා.

සල්ලි දෙන්න, වෙනදා වගේ ඉබි කොල්ලට කතා කළත්, එයා ආවේ නෑ. සල්ලි මේසය උඩින් තියපු, කිඹුල් හාමි ෆෝන් එක දිහා බලා ගෙනම ආපහු යන්න හැරුනා.



එත්, අද ඉඹුල් කිරිබත් එක නම්, එච්චර හරි නෑ වගේ. කිඹුල් හාමිට බඩ රිදෙනවා. ෆෝන් එක බල බල ඉන්න බැරි තරම්, බඩ රිදෙනවා. බඩ ඇතුලෙන් හූරනවා වගේ. බඩ හරියට රිදෙනවා. අද ඉඹුල් කිරිබත් නම් හරිම නරක විදිහට තමා ඉබි කොල්ලා හදලා තියෙන්නේ, කිඹුල් හාමි කිව්වා. කිඹුල් හාමි බඩ රිදෙනවා කියලා, මහ හයියෙන් කෑ ගහුවා.



ගඟේ යාළුවෝ, කිඹුල් හාමිව කොරවක් වෙද හාමිනේ ගාවට අරන් ගියා. මොකද ලෙඩේ? එයා ඇහුවා . බඩේ ලෙඩේ, කිඹුල් හාමි කිව්වා.



කොරවක් හාමිනේ ගොළු බෙලි කට්ටක් කිඹුල් හාමිගේ බඩට තියලා, කන තියාගෙන හිටියා. කොරවක් හාමිනේගේ ඇස් ලොකු වුණා. කිඹුල් හාමිගේ බඩ අතුලේ කවුදෝ කෑගහනවා. කොරවක් හාමිනේ කිඹුල් හාමිට ගඟේ වතුර ගොඩක් බීලා, උගුරේ ඇඟිල්ල ගහලා වමනේ කරන්න කිව්වා,



ඔයාලා දන්නව ද? කිඹුල් හාමිගේ බඩෙන් එළියට ආවේ කවුද කියලා,

ඉබි කොල්ලා!

කිඹුල් හාමි ෆෝන් බල බල කිරි මැටි ඉඹුල් කිරිබත් කියලා ගිලලා තිබුණේ ඉබි කොල්ලාව යි.

ඒකනේ, එයා කෑම කාලා සල්ලි ගෙවන්න යද්දි, ඉබි කොල්ලා හිටියේ නැත්තේ. ඉබි කොල්ලා, කිඹුල් හාමි ෆෝන් එක බලාගෙන කරපු නොසැකිලිමත් වැඩේට එයාට හොඳට ම බැන්නා.



කිඹුල් හාමිට කරපු වරද තේරුණා. එයාට වුණ ඔක්කොම කරදර වලට හේතුව, හැම වෙලාවෙම ෆෝන් එක බල බල ඉන්න එක කියලා තේරුණා. ෆෝන් එක ගඟට විසි කළා.

ඉබි කොල්ලාගෙන් සමාව ගත්තා. කිඹුල් හාමි යාළුවෝ ඔක්කෝම සමග සතුටින් කල් ගත කළා.



අපිත් කිඹුල් හාමි වගේ හැම වෙලාවෙම ෆෝන් බලනවා නේද ? අපිටත් මේක හොඳ පාඩමක් නේද යාළුවනේ ?



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

9 786242 084862